මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය 2025

සන්නිවේනය හා මාධ්‍ය අධ්‍යයනය - 10 ශ්‍රේණිය

II පත්‍රය කාලය : පැය02

- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක්ද, ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01 සොඳුරු වත්ත තරුණ කැළගේ මූලිකත්වයෙන් හා ප්‍රදේශවාසීන්ගේ සහයෝගයෙන් "බක්මහ උදානය "නමින් අවුරුදු උත්සවයක් පවත්වන ලදි. මේ සඳහා එක්තරා පෞද්ගලික මාධ්‍ය ජාලයක් දායකත්වය ලබා දෙන ලදි.

I. මෙම අවුරුදු උත්සව අවස්ථාව තුළ දක්නට ලැබුණු සන්නිවේදන වර්ගය නම් කරන්න.
II. එම සන්නිවේදන වර්ගය තුළ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න
III. ජනමාධ්‍ය හිමිකම අනුව බෙදා දක්වන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
IV. "බක්මහ උදානය " අලුත් අවුරුදු උත්සවයට ආරාධනා පත්‍ර සැකසීමට D.T.P ක්‍රියාවලිය යොදා ගන්නා ලදි. එහි පියවර ලියන්න.
V. අලුත් අවුරුදු උළලේ දෘශ්‍ය සන්නිවේදනය ක්‍රියාත්මක වන තරග ඉසව්වක් නම් කරන්න.
VI. එදින පැමිණි මාධ්‍ය ජාලය විසින් "බක්මහ උදානය " ප්‍රාචාරක කටයුතු සඳහා අභිසාරී මාධ්‍යය කලාව යොදාගත යුත්තේ කෙසේද?
VII. අවුරුදු ක්‍රීඩාවක් වූ ඔලිඳ කෙළිය තුල ක්‍රියාත්මක සන්නිවේදන ස්වරූපය කුමක්ද?
VIII. එදින පැමිණ සිටියේ FM මාධ්‍ය ජාලයක් නම් එහි සංවිධාන ව්‍යුහයේ මුල් පියවර දෙක ලියන්න.
IX. උළෙල ආරම්භ කිරීමට යොදා ගත් නැකැත් පත්‍රය එලදායී ලේඛණයකි. එහි අන්තර්ගත ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.
X. උත්සවය සංවිධානය කළ තරුණයෙකුට එක් වීඩියෝවක් කොරියාවේ සිටි තම මිතුරාට යැවීමට අවශ්‍ය විය. ඒ සඳහා යොදාගත් ක්‍රමවේදය කුමක්ද?

(ලකුණු 2×10=20)

02 රූපවාහිනිය නූතන ජනමාධ්‍ය අතර වඩාත් ජනප්‍රිය ජන මාධ්‍යයයි.

I. 1979 දී ආරම්භ කළ ප්‍රථම රූපවාහිනී සේවය කුමක්ද? (ලකුණු 01)
II. රූපවාහිනිය අධික වියදම් මාධ්‍යයකි. එහි වියදම් පියවා ගැනීමට යොදාගන්නා පියවර දෙකක් ලියන්න. (ලකුණු 02)
III. ජනමාධ්‍යය සතු ලක්ෂණ 3 ක් පැහැදිලි කරන්න. (ලකුණු 03)
IV. රූපවාහිනී වැඩසටහන් වර්ග 4 ක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

03 වර්තමාන සමාජයේ බොහෝ කාර්යයන් ඉටු කර ගැනීමට මාධ්‍ය උපකරණ බහුලව භාවිතා කරයි.

I. පේජරයේ කාර්යභාරය කුමක්ද? (ලකුණු 01)
II. දුරකතන භාවිතයේදී ඔබ විසින් පිළි පැදිය යුතු ආචාර ධර්ම දෙකක් නම් කරන්න. (ලකුණු 02)
III. පිටු පෙරලනයේ වාසි තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 03)
IV. CCTV මගින් පුද්ගලයෙකුට ලගා කරගත හැකි ප්‍රයෝජන 04 ක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

04 පුවත් පතක් තුළ හිමිකාරීත්වය හා කතෘ මණ්ඩලයේ මතය නිරූපණය වන ලිපි නිරතුරුව දක්නට ලැබේ.

I. පුවත්පත් තුළ දැකිය හැකි එවැනි ලිපි වර්ගයක් නම් කරන්න. (ලකුණු 01)

II. පුවත්පත් ආයතනයක තනතුරු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

III. මාණ්ඩලික මාධ්‍ය වේදියා හා ප්‍රාදේශීය මාධ්‍යවේදියා අතර වූ මූලික වෙනස් කම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

IV. "මාධ්‍ය ආයතනයක වාණිජ අරමුණු සමාජයට අයහපත් බලපෑමක් ගෙන එයි" කරුණු 04 ක් ආශ්‍රයෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

05 මානවයා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට තම සන්නිවේදන කාර්යය ඉටු කර ගත් අතර අද වන විට එය ඉතා දියුණු මට්ටමක පවතී.

I. ප්‍රාග් ඓතිහාසික යුගය හඳුන්වන නම කුමක්ද ? (ලකුණු 01)

II. මානවයා රංචු වශයෙන් ජීවත් වන විට යොදා ගත් ප්‍රාතමික සන්නිවේදන මාධ්‍ය දෙකක් ලියන්න. (ලකුණු 02)

III. සංස්කෘතික පැවැත්ම සඳහා එක් එක් ජන කණ්ඩායම් භාවිත කරන ලද සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

IV. සන්නිවේදනයේ ඓතිහාසික විකාශනයේ සිදු වූ වැදගත් සිදුවීම් හතරක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

06 සන්නිවේදනය විධිමත් හා අවිධිමත් ලෙස සමාජය තුල දක්නට ලැබේ.

I. සන්නිවේදන ස්වරූප දෙක නම් කරන්න. (ලකුණු 01)

II. පාසල තුල විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

III. විධිමත් සන්නිවේදන ආකෘතියක් ඇඳ නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 03)

IV. අවිධිමත් සන්නිවේදනයේ අවශ්‍යතාවය දක්වා විධිමත් සන්නිවේදනයේ හා අවිධිමත් සන්නිවේදනයේ දී ඔබ ක්‍රියා කළ යුතු ආකාරය දක්වන්න. (ලකුණු 04)

07 පුද්ගලයන් සංඛ්‍යාව අනුව සන්නිවේදනය වර්ගීකරණය කරයි.

I. සන්නිවේදන බාධක වර්ග නම් කරන්න. (ලකුණු 01)

II. සන්නිවේදනය පිළිබඳ ලැස්වෙල් අර්ථකතනය ලියන්න. (ලකුණු 02)

III. පුද්ගලාන්තර සන්නිවේදනය හා සමූහ සන්නිවේදනයේ වෙනස් කම් තුනක් සංසන්දනාත්මකව ලියන්න. (ලකුණු 03)

IV. පාසලේ දී අධ්‍යාපන ක්‍රියාවලියට ප්‍රක්ෂේපන උපකරණ යොදා ගැනීමේ වාසි හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04)